## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
## නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන

***ජාතියේ අවශ්‍යතාවය වන ශ්‍රී ලාංකේය නිපුණතාවයන් තහවුරු කිරීම සඳහා කොටස්කරුවෙකු වන්න.***

# පුරප්පාඩු

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත්, පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## PS 4 මට්ටම (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2016 අනුව)

| අංකය | තනතුර | සුදුසුකම් - (පහත 1හෝ 2 ) | තෝරා ගැනීමේ ක්‍රමවේදය | මාසික වැටුප |
|---|---|---|---|---|
| 01 | සහකාර ප්‍රසම්පාදන විශේෂඥ (පුරප්පාඩු 01) | **1).** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අන්තර් මාධ්‍ය (intermediate) විභාගයක් සමත් වී තිබීම.<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් (Post Qualifying Experience) සහිත පළපුරුද්ද.<br><br>**2.)** රජයේ දීප ව්‍යාප්ත සේවයන්හි II / III පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්ත්වයක්<br>**සමඟ**<br>රජයේ දීප ව්‍යාප්ත සේවයන්හි II / III පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 11ක පළපුරුද්ද | සුදුසුකම් හා පළපුරුද්ද අනුව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. | රු. 155,000.00 හා ජීවන වියදම් දීමනාව |

## PS 5 මට්ටම ( කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/ 2016 අනුව )

| අංකය | තනතුර | සුදුසුකම් - (පහත 1හෝ 2 හෝ 3) | තෝරා ගැනීමේ ක්‍රමවේදය | මාසික වැටුප |
|---|---|---|---|---|
| 02 | පරිසර ආරකෂණ නිලධාරී (පුරප්පාඩු 01) | 1.) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ උපාධියක්<br>**හෝ**<br>තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් කාර්මික ක්ෂේත්‍රයක තනතුරකට අදාළව නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 07 මට්ටමට නොඅඩු ප්‍රවීනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.<br>**සහ** | සුදුසුකම් හා පළපුරුද්ද අනුව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත. | අදාළ වෙනත් දීමනා සමඟ රු. 105,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | අවශ්‍ය විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද<br><br>2.) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් කාර්මික ක්ෂේත්‍රයක තනතුරකට අදාළව නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 06 මට්ටමට නොඅඩු ප්‍රවීනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>අවශ්‍ය විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද<br><br>3.) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් කාර්මික ක්ෂේත්‍රයක තනතුරකට අදාළව නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු ප්‍රවීනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>අවශ්‍ය විශේෂිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද | | |

**සැලකිය යුතුයි** : සහකාර ප්‍රසම්පාදන විශේෂඥ සහ පරිසර ආරක්ෂණ නිලධාරී තනතුරුවල TOR සඳහා www.ssdd.lk වෙබ් අඩවිය බලන්න.

**වයස : 2017.10.23 දිනට වයස අවු. 65 ට අඩු විය යුතුය.**

**වැටුප් පරිමාණය:**

2016.03.24 දිනැති අංක 01/ 2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව වැටුප් පදනම් වේ. ඒ අනුව, රජයේ දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් ඉහත තනතුරු සඳහා පත්කෙරෙන නිලධාරීන් සඳහා දැනට ලබන වැටුප සහ අදාළ වරප්‍රසාදවලට අමතරව, වැඩසටහනෙහි අදාළ තනතුරේ මූලික වැටුපෙන් 50% ක දීමනාවක් ලබාදේ. තවද, ඉහත තනතුරු සඳහා රජයේ දීපව්‍යාප්ත සේවා වලින් පරිබාහිරව බඳවාගන්නා නිලධාරීන් සඳහා ඉහත එක් එක් තනතුරට අදාළව සඳහන් කර ඇති පරිදි වැටුප් ලබාදේ.

**සේවා කොන්දේසි:**

දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අයත්වන නිලධාරීන් ස්ථානමාරු පදනම මත පත්කෙරෙන අතර, රජයේ සේවයෙන් පරිබාහිර පුද්ගලයන් කොන්ත්‍රාත් පදනම මත පත්කෙරේ. සියළුම පත්වීම් ආරම්භක වශයෙන් එක් අවුරුද්දක් සඳහා සිදු කෙරෙන අතර, සතුටුදායක කාර්යසාධන ඇගයීමක් යටතේ වාර්ෂිකව දීර්ඝ කිරීම සිදුකළ හැක. 2016.03.24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ සියළුම කොන්දේසි පත්වීම් කිරීම් සම්බන්ධයෙන් අදාළ වේ.

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ www.ssdd.lk වෙබ් අඩවිය මගින් අයදුම්පත් බාගත කර ගත හැකි අතර, යෝග්‍යතාවයන් සනාථ කිරීම පිණිස අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතිකපත්වල පිටපත්ද සමග සියළුම අයදුම්පත්, **අතිරේක ලේකම් / ප්‍රධාන විධායක නිලධාරී, නිපුණතා ආංශික සංවර්ධන අංශය, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය,** අංක **354 /2, "නිපුණතා පියස", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** යන ලිපිනයට **2017.10.23** දින හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. රාජ්‍ය / සංස්ථා/ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

**ලේකම්**

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය,**

අංක 354 /2, "නිපුණතා පියස",

ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05